# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
# காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
# LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத்த மெதுர", காணிச் செயலகம், 1200/6, இராஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretriat, 1200/6, Rajamalwatta Road, Battaramulla.

☎ 011 279 7400
🖷 011 286 4051


මගේ අංකය / எனது இல / My No. } 3/1/6
ඔබේ අංකය / உமது இல / Your No. }
දිනය / திகதி / Date } 2020.05. 18

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

<u>රජයේ ඉඩම් ආඥා පනතේ 6(1) වගන්තියට අනුව</u>

<u>විශේෂ ප්‍රදානපත්‍ර ලබාදීම.</u>

රටේ සංවර්ධන වැඩසටහන් කඩිනම් කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය යටතේ ඇති සංවර්ධන ව්‍යාපෘතීන් වේගවත්ව සිදුකිරීම සම්බන්ධව අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති කාර්යාලයේ පැවති සාකච්ඡාවේදී නාගරික සංවර්ධන අධිකාරිය වෙත රජයේ ඉඩම් ලබාදීම පිළිබඳව සාකච්ඡා ලදී. ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරිය වෙත සංවර්ධන කාර්යයන් සඳහා අත්පත් කරගන්නා ලද ඉඩම්, එම අධිකාරියට ප්‍රදාන පත්‍රයක් මගින් ලබාදීම කඩිනමින් අවසන් කළ යුතුව ඇත. එබැවින් නාගරික සංවර්ධන අධිකාරිය වෙත අත්පත් කරගත් ඉඩම් සඳහා ප්‍රදානපත්‍ර ලබාදීමේ කටයුතු කඩිනම් කිරීමේ අරමුණින් මෙම උපදෙස් පත්‍රිකාව නිකුත් කරනු ලැබේ.

02. ප්‍රදානපත්‍ර සැකසීම සඳහා නිර්දේශ වාර්තා එවීමේදී විශාල ලේඛන සංඛ්‍යාවක් සකස් කිරීමට සිදුවීමත්, විවිධ ආයතනවල එකඟතාවය ලබාගැනීම සඳහා යොමු කිරීමට සිදුවීමත්, 'ඕ' රේඛා චිත්‍රය ලබාගැනීම ප්‍රමාදවීමත් යන කාරණා හේතු කොටගෙන ප්‍රදානපත්‍ර ලබාදීම ප්‍රමාද වන බව මා වෙත නිරීක්ෂණය වී ඇත. 1950 අංක 09 දරණ ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ විධිවිධානවලට අනුකූලව අත්පත් කටයුතු අවසන් කර පනතේ 44 වගන්තිය අනුව හිමිකම් සහතිකය නිකුත් කර ඇති අවස්ථාවක, 6 (1) වගන්තිය අනුව විශේෂ ප්‍රදානපත්‍ර ලබාදීමේදී පහත පරිදි කටයුතු කරන ලෙස සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත මෙමගින් දන්වා සිටිමි. ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් ප්‍රදානපත්‍ර ලබාගැනීමට ඉල්ලීමක් ලද පසු පහත සඳහන් ලේඛන සම්පූර්ණ කර එම ලේඛන සෘජුවම ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යොමුකරන්න.නිර්දේශ වාර්තා එවන අවස්ථාවේදී ම "ඕ" රේඛා චිත්‍රය ලබා ගැනීම සඳහා මැනුම් ඉල්ලීමද මිනින්දෝරු අධිකාරිය වෙත යොමු කරන්න.

1. ඉල්ලීම් ලිපිය
2. ඔබගේ නිර්දේශය සහිත 223 ආකෘතිය
3. තත්ත්ව වාර්තාව
4. "ඕ" රේඛා චිත්‍රය ලබාගැනීම සඳහා වූ මැනුම් ඉල්ලීම් පිටපතක්.

03. ප්‍රදානපත්‍ර සඳහා නිර්දේශ වාර්තා එවන අවස්ථාවේදී 44 සහතිකය අවලංගු කිරීම ලියාපදිංචි කිරීම නොකළ යුතුය. මා විසින් ප්‍රදානපත්‍රය සකස් කර ඔබ වෙත ලබාදීමෙන් පසු 44 සහතිකය අවලංගු කිරීමත්, ප්‍රදානපත්‍රය ලියාපදිංචි කිරීමත් යන දෙකම එකවර සිදුකිරීමට කටයුතු කරන්න.

04. රටේ සංවර්ධන ව්‍යාපෘතීන් අඛණ්ඩව හා ක්‍රමවත්ව සිදුකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට අත්පත් කරගත් ඉඩම් ප්‍රමාදයකින් තොරව එම ආයතනයට ප්‍රදානපත්‍ර මගින් බැහැර කිරීම සඳහා මෙම ලිපියේ උපදෙස් අනුව කටයුතු කරන ලෙසත් රජයේ ඉඩම් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ප්‍රදාන පත්‍ර මගින් බැහැර කිරීමේදී සාමාන්‍ය ක්‍රමවේදය යටතේ නිර්දේශ වාර්තා එවන ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

ආර්.එම්.සී.එම්.හේරත්
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත් :

1. ජනාධිපති ලේකම් - කරු.දැ.ගැ.ස.
2. ලේකම්, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස.
3. මිනුම්පති, මිනින්දෝරු දෙපාර්තමේන්තුව - කරු. "ඔ " රේඛා චිත්‍රය නිකුත් කිරීම කඩිනම් කිරීම සඳහා.
4. අධ්‍යක්ෂ ජනරාල්, නාගරික සංවර්ධන අධිකාරිය - කරු.අදාල කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා.
5. සියලුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන්/අන්තර් පළාත් (ඉඩම් කොමසාරිස්වරුන්/සහකාර ඉඩම් කොමසාරිස් වරුන්) - කරු.දැ.ගැ.ස.